**වනාතවිල්ලුව ප්‍රාදේශීය සභාව**
**පුත්තලම දිස්ත්‍රික්කය**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මූල්‍ය ප්‍රකාශණ ඉදිරිපත් කිරීම**

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 09 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 ඔක්තෝබර් 30 දින සභාපතිවරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2017 දෙසැම්බර් 31 දිනට වනාතවිල්ලුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිලිබඳ අදහස් දැක්වීම**

**1.3.1 ගිණුම්කරණ අඩුපාඩු**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ ) 2016 වර්ෂයට අදාලව ලැබියයුතු මුද්දර ගාස්තු රු413,075 ක් මූල්‍ය ප්‍රකාශනවල අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) වාහන අනතුරු රක්ෂණ ප්‍රතිපූර්ණ ලැබීම් රු.237,322 ක් පොදු තැන්පත් ගිණුමට බැර කර තිබුණි.

**1.3.2 නොසැසඳුණු ගිණුම්**

ගිණුම් විෂයයන් 05 ක උපයෝගී පොත් / උපලේඛන අනුව ශේෂ හා මූල්‍ය ප්‍රකාශන අනුව වූ ශේෂ අතර රු.362,508 ක වෙනස්කම් පැවතුණි.

**1.3.3 නීති , රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති , රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| | රු. | |
| (අ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | | |
| (i) 5(3) රීතිය | 2,113,010 | ආදායම් එක් රැස් කිරීම සම්බන්ධයෙන් අභ්‍යන්තර පරීක්ෂාවක් සිදුකර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ii ) 5 (7) රීතිය | - | ගබඩා ගනුදෙනු සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි. |
| (iii) 33 රීතිය | 633,323 | වරිපනම් බදු හා අක්කර බදු ගෙවීම් පැහැර හරින පුද්ගලයන් පිළිබඳ ලැයිස්තුවක් එක් එක් කාර්තුව අවසානයේදී පිළියෙල කර නොතිබුණි. |
| (iv) 61 රීතිය | - | කර්මාන්ත, වෙළඳ ව්‍යාපාර හා වෘත්තීන් පිළිබඳ සමීක්ෂණ සිදුකර නොතිබුණි. |
| (v) 64 රීතිය | - | ගෙවීම් පිළිබඳ නිසැකවීම සඳහා කර්මාන්ත බදු ලේඛනයේ සඳහන් නොගෙවූ විෂයයන් පිළිබඳ සතියක් හැර සතියක් සම්පූර්ණ පරීක්ෂාවක් කර නොතිබුණි. |
| (vi) 217 සහ 218 රීති | 94,969,642 | සභාවට අයත් ඉඩම් සහ ගොඩනැගිලි පිළිබඳ ලේඛන නොතිබුණු අතර, වාර්ෂික සමීක්ෂණයද සිදුකර නොතිබුණි. |
| (ආ ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 104 | - | 2017 මාර්තු 13 හා සැප්තැම්බර් 09 දිනවල සභාවට අයත් මෝටර් ග්‍රේඩරයේ වම්පස වීදුරුවට සිදුවී තිබුණු හානිය වාර්තා කර නොතිබුණු අතර, වගකීම නිශ්චය කර නොතිබුණි. |
| (ඇ) 2002 නොවැම්බර් 28 දිනැති අංක අයි.ඒ.අයි./2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | 915,286 | සභාව සතු පරිගණක හා පරිගණක උපාංග සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2 .1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන ආදායම ඉක්මවූ වියදම රු.374,808ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.11,810,047ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තු ගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| (i) වරිපනම් හා බදු | 805 | 814 | 881 | 933 | 818 | 582 | 352 | 1,000 |
| (ii) කුලී | 32,927 | 2,153 | 2,026 | 1,484 | 33,770 | 25,169 | 1,824 | 1,357 |
| (iii) බලපත්‍ර ගාස්තු | 325 | 199 | 199 | - | 236 | 199 | 199 | - |
| (iv) වෙනත් ආදායම් | 7,280 | 52,386 | 52,824 | 14,890 | 6,590 | 3,743 | 2,932 | 15,328 |

සටහන:- රැස්කළ ආදායම තුල සමාලෝචිත වර්ෂයට බිල්කළ ආදායමෙන් එකතුකිරීම් සහ ඉකුත් වර්ෂවල හිඟ ආදායමින් එකතු කිරීම්ද ඇතුළත් වේ.

### 2.2.2 ආදායම් රැස් කිරීමේ කාර්ය සාධනය

---------------------------------------

සමාලෝචිත වර්ෂයට බිල්කළ ආදායම් රු. මිලියන 55.1 කින් රු. මිලියන 42.4 ක් වර්ෂය තුල රැස්කරගෙන තිබුණු අතර එය සියයට 76 කට සමාන අගයක් විය. සමාලෝචිත වර්ෂය ආරම්භයට පැවති රු. මිලියන 17.6 ක් වූ හිඟ ආදායමෙන් රු. මිලියන 13.4 ක් රැස්කරගෙන තිබුණු අතර, වර්ෂය අවසානයට තවදුරටත් රු. මිලියන 17.3 ක් අයකර ගැනීමට තිබුණි.

### 2.2.3 වරිපනම් හා බදු

----------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සභා බලප්‍රදේශයේ සමාලෝචිත වර්ෂයේදී හා ඉකුත් වර්ෂවලදී සිදුකර තිබුණු ගොඩනැගිලි වැඩිදියුණු කිරීම් සඳහා තාවකාලික තක්සේරු ලබාදී ආදායම් උපයා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) වර්ෂ 18 කට පෙර ලබාගෙන තිබුණු තක්සේරු අගයන් මත දිගින් දිගටම වරිපනම් බදු අයකිරීම සිදුකර තිබුණි.

(ඇ ) වර්ෂ 03 ක් ඉක්මවා තිබුණු රු.575,507 ක් වූ හිඟ වරිපනම් බදු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

### 2.2.4 කුලී

-------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.292,781ක් වූ හිඟ බදු කුලියෙන් රු.115,026 ක් වර්ෂයකට වැඩි කාලයක සිට අය නොවී පැවතුණි.

(ආ) 2017 දෙසැම්බර් 31 දිනට රු.1,079,356 ක්වූ හිඟ කඩ කුලියෙන් රු.521,000 ක් වර්ෂ 03 කට වැඩි කාලයක සිට අයවීමකින් තොරව පැවතුණි.

### 2.2.5 වෙනත් ආදායම්

------------------

සභාවට අයත් ජල ඒකකයක් මගින් බෙදාහැර තිබුණු ජලය වෙනුවෙන් රු.786,255 ක් වූ ජල ගාස්තු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

### 2.2.6 උසාවි දඩ හා මුද්දර ගාස්තු

------------------------------

පළාත් ප්‍රධාන ලේකම්වරයාගෙන් 2017 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු උසාවි දඩ රු.107,168 ක් හා මුද්දර ගාස්තු රු.2,474,577 ක් විය.

**3.** **මෙහෙයුම් සමාලෝචනය**

**3.1** **කාර්යසාධනය**

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටුකලයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳ අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ ) අතුරු ව්‍යවස්ථා

ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවක් විසින් අතුරු ව්‍යවස්ථා පනවා අදාල සේවාවන් මහජනතාව වෙනුවෙන් ඉටුකල යුතු නමුත් 2017 දෙසැම්බර් 31 දින වන විට කාරණා 03 ක් වෙනුවෙන් පමණක් අතුරු ව්‍යවස්ථා පනවා තිබුණි.

(ආ ) අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

ඇස්තමේන්තු ප්‍රතිපාදන රු.6,565,000 කින් මාර්ග 36 කට බොරළු දැමීමට සහ රු.250,000 කින් මාර්ග 6ක් කොන්ක්‍රීට් කිරීමට සැළසුම් කර තිබුණද සැළසුම් කර තිබුණු මාර්ග 03ක හා ඊට පරිබාහිර මාර්ග 12 කට බොරළු යොදා තිබුණු අතර, එක් මාර්ගයක් පමණක් කොන්ක්‍රීට් කර තිබුණි.

(ඇ ) අත්හැර දැමූ කාර්යයන්

අඩු ආදායම්ලාභී පවුල්වලට වැසිකිළි උපකරණ ලබාදීමේ වැඩසටහන ක්‍රියාත්මක කර නොතිබුණු අතර ජල සැපයුම් හා වෙනත් උපයෝගී සේවා යටතේ රුපියල් මිලියන 10 ක් වූ ව්‍යාපෘති 8 ක් හා රුපියල් මිලියන 2.5 ක් වූ ව්‍යාපෘති 03 ක් ඉටු කර නොතිබුණි.

(ඈ) පාරිසරික ගැටළු

ප්‍රාදේශීය ස්වභාවික පරිසරය ආරක්ෂා කිරීම සභාවේ මෙහෙවරෙහි කොටසක් වුවද, කලපු තීරය ආරක්ෂා කිරීම, සංවර්ධනය කිරීම, එහි මත්ස්‍ය සම්පත වර්ධනය කිරීම සහ ඒ තුලින් ප්‍රදේශයේ ජනතාවගේ ජීවන තත්ත්වය උසස් කිරීම සඳහා සභාව විසින් කිසිදු පියවරක් ගෙන නොතිබුණි.

(ඉ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

පහත කරුණු නිරීක්ෂණය විය.

(i) සභාව විසින් දිනකට කසළ ටොන් 5 ක් පමණ එකතු කරනු ලබන අතර ඉන් සුළු ප්‍රමාණයකින් කොම්පෝස්ට් පොහොර නිපදවා ඉතිරි සියළුම කසල පරිසරයට බැහැරකර පස් දැමීම සිදුකරමින් පැවතුණි.

(ii) කසළ රැස්කරන ස්ථානයන්හි එකතුවන අන්තරාදායි අපද්‍රව්‍ය, ඉලෙක්ට්‍රොනික් අපද්‍රව්‍ය හා ප්ලාස්ටික් අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා විධිමත් ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි.

(iii) රු.3,807,268 ක් වැයකර නිමකර තිබුණු කොම්පෝස්ට් අංගනයේ කටයුතු සඳහා ප්‍රමාණවත් සේවක සංඛ්‍යාවක් අනුයුක්ත කර නොතිබුණි.

(ඊ) තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක

"තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය 2030" අදාලව තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීමේ මූලික පියවරයන් වශයෙන් විවිධ කර්තව්‍යයන් 10 ක් කෙරෙහි සභාවේ අවධානය යොමුකර තිබුණි. අවශ්‍ය මානව සහ භෞතික සම්පත් මෙන්ම තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක මැනීම සඳහා සභාව නියමිත දර්ශක හඳුනාගෙන නොතිබුණු අතර, මෙම අරමුණු කරා ළඟාවීම සම්බන්ධයෙන් උනන්දුවක් දක්වන පාර්ශවයන් හඳුනාගෙන නොතිබුණි.

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සභාව විසින් පවත්වාගෙන යනු ලබන ජල ව්‍යාපෘතියට අයත් සියළුම පාරිභෝගික ඒකකවලට ජල මනු සවිකර නොතිබීම හේතුවෙන් සභාවට ලබාගත හැකිව තිබුණු සැළකිය යුතු ආදායම් අහිමි වී තිබුණි.

(ආ) අක්කර බදු ලේඛනය යාවත්කාලීනව පවත්වාගෙන නොතිබුණි.

(ඇ) සභාව විසින් පරිහරණය කරන ඉඩම් හා ගොඩනැගිලි නීත්‍යානුකූලව සභාවට පවරාගෙන නොතිබීම හේතුවෙන් හිඟ කඩ කුලී යනාදිය අයකර ගැනීම සඳහා නීතිමය පියවර ගැනීමට නොහැකිවී තිබුණි.

## 3.3 මානව සම්පත් කළමනාකරණය

2017 දෙසැම්බර් 31 දිනට සභාවේ මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියෙක් අතිරික්තව සිටින අතර, ආදායම් පරීක්ෂක තනතුරක් පුරප්පාඩු වී තිබුණි.

## 3.4 වත්කම් කළමනාකරණය

### 3.4.1 නඩත්තු හා අළුත්වැඩියා සිදු නොකිරීම

සභාවට අයත් නල ළිං 75 විධිමත් පරිදි නඩත්තු කර නොතිබීම හේතුවෙන් විනාශ වී තිබුණි.

### 3.4.2 නිෂ්ක්‍රීය / ඌන උපයෝජිත වත්කම්

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) එකතු වටිනාකම රු.630,000 ක් වූ ට්‍රැක්ටර් 02ක්, ජල බවුසරයක් සහ වටිනාකම අනාවරණය නොවූ ට්‍රැක්ටරයක් වර්ෂ 02 කට වැඩි කාලයක සිට නිශ්ක්‍රීයව පැවතුණි.

(ආ) රු.600,000ක් වටිනා විදුලි මෝටර්, ජල පොම්ප, ඩීසල් එන්ජින් වැනි ජල පොම්පාගාර උපකරණ වර්ෂ 04 ත් 07 ත් අතර කාලයක් තුල නිශ්ක්‍රීයව පැවතුණි.

(ඇ) සභාව සතු රු.7,967,144ක් වූ ගල් රෝල සමාලෝචිත වර්ෂයේදී මීටර් පැය 80.5ක් පමණක් සේවයේ යොදවාගෙන තිබුණු අතර, එම කාලය තුල උපයාගත් රු.71,720 ක් වූ ආදායමට සාපේක්ෂව රු.137,067 ක් වැයකර තිබුණි.

**3.5 හඳුනාගත් පාඩු**

-------------------

රු.70,515 ක් වූ පුස්තකාල පොත් ප්‍රමාණයක් භාණ්ඩ සමීක්ෂණය සඳහා ඉදිරිපත් කර නොතිබුණු අතර රු.71,885 ක් වූ බැහැර දෙන ලද පුස්තකාල පොත් ප්‍රමාණයක් ආපසු ලැබී නොතිබුණි.

**3.6 වාහන උපයෝජනය**

---------------------

සභාව සතු ට්‍රැක්ටර් රථ 03ක් සමාලෝචිත වර්ෂයේදී මීටර් පැය 723 ක් පමණක් සේවයේ යොදවා තිබුණි.

**4. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය**

---------------------------------------

**4.1 අයවැය පාලනය**

------------------

ඇස්තමේන්තුගත මුළු පුනරාවර්තන වියදම්වලින් සියයට 21 ක් හා ඇස්තමේන්තුගත මූලධන වියදම්වලින් සියයට 73 ක් ඉතිරි වී තිබුණි.

**4.2 අභ්‍යන්තර විගණනය**

------------------------

සභාවේ මූල්‍ය හා මෙහෙයුම් කටයුතු සම්බන්ධයෙන් ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සමාලෝචිත වර්ෂය තුල සිදුකර නොතිබුණි.

**5 . පද්ධති හා පාලන**

--------------------

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමු කර ඇති අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කල යුතුය.

| පද්ධතිය | අඩුපාඩුව |
|---|---|
| (අ) ආදායම් පාලනය | (i) වරිපනම් නව තක්සේරු හා වැඩි දියුණු කිරීම සඳහා තක්සේරු ලබාගෙන නොතිබීම<br>(ii) අක්කර බදු ලේඛන යාවත්කාලීන නොකිරීම<br>(iii)වෙළඳ බලපත්‍ර සමීක්ෂණ විධිමත්ව සිදුකර නොතිබීම |
| (ආ) ස්ථාවර වත්කම් පාලනය | (i) ඉඩම්වල අයිතිය පවරාගෙන නොතිබීම<br>(ii) සියළු වත්කම් ලේඛන ගත කර නොතිබීම |
| (ඇ) කසළ කළමනාකරණය | (i) කසළ ප්‍රතිචක්‍රීකරණ ඒකකය ක්‍රියාත්මක නොකිරීම<br>(ii) පරිසර හිතකාමී ලෙස කසල බැහැර නොකිරීම |
| (ඉ) සේවක ණය | (i) සේවක ණය ලේඛන යාවත්කාලීනව පවත්වා නොතිබීම<br>(ii) හිඟ සේවක ණය අයකර ගැනීමට කටයුතු නොකිරීම |